මාතලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 23 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| වර්ෂ තුනකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ලැබිය යුතු ශේෂය රු.807,368 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු, අක්කර බදු හා ජල ගාස්තු අයකර ගත හැකි ශේෂ අයකර ගැනීමටත්, අයකර ගත නොහැකි ශේෂ කපා හැරීමටත් කටයුතු කරමි. වසර 3 කට වැඩි කාලයක සිට හිඟව ඇති මුද්දර ගාස්තු රු.27,000 ක් මේ දක්වා ලැබී නැත. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

| | | |
|---|---|---|
| වර්ෂ තුනකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ගෙවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.2,157,299 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ පාර්ශව වෙත ගෙවීම් කිරීමට කටයුතු කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

තොරතුරු ඉදිරිපත් නොකිරීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.61,166,291 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලේඛන සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම කළ යුතු වේ. | දේපළ අයිතිය තහවුරු කරගෙන ඉදිරි කටයුතු සිදුකරමි. |

1.4 අනුකූල නොවීම

--------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 සහ 572 | කල් ඉකුත්වූ තැන්පතු ශේෂ 8 ක් හා කර්මාන්ත තැන්පත් ශේෂ 62 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මාස 3 ක් තුළ නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවේ වාහන 12 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වේ. | කඩිනමින් ඉන්ධන දහනය පරිකෂා කර වාර්තා ඉදිරිපත් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,712,130 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,767,098 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 5,276,200 | 1,247,088 | 3,353,109 | 584,442 | 7,849,000 | 8,717,038 | 6,462,041 | 4,721,011 |
| (ii) | කුලී | 1,405,000 | 390,020 | 551,325 | 26,095 | 25,001,000 | 453,805 | 1,855,910 | 26,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,400,000 | - | 1,406,592 | - | 5,800,000 | - | 5,430,400 | - |
| (iv) | වෙනත් ආදායම් | 22,026,000 | 7,372,742 | 17,277,605 | 3,709,745 | 24,433,000 | 22,100,000 | 4,005,392 | 21,257,306 |
| | එකතුව | 30,107,200 | 9,009,850 | 22,588,631 | 4,320,282 | 63,083,000 | 31,270,843 | 17,753,743 | 26,004,817 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතනවලින් අය විය යුතු රු.25,507 ක ශේෂයක් පැවතුණි. | ලැබිය යුතු ශේෂයන් අයකර ගත යුතු වේ. | හිඟ ශේෂය අය කිරීමට කටයුතු කරමි. |
| **(ආ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ආදායම රු.223,215 ක් වූ අතර වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන මෙම ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් හඳුනාගෙන ලැබිය යුතු ශේෂයන් අය කළ යුතු වේ. | හිඟ ශේෂයන් හඳුනාගැනීමේ කටයුතු සිදුකර ඇති අතර ඒ අනුව තවදුරටත් අය කර ගත නොහැකි ශේෂයන් විධිමත් අනුමැතිය යටතේ ඉවත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) ජල ගාස්තු

------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු මුළු හිඟ ජල ගාස්තු ආදායම රු.3,709,745 ක් වූ අතර මෙයින් රු.2,504,865 ක් හෙවත් සියයට 68 ක් වර්ෂයක් ඉක්මවා හිඟව පැවතුණි. මෙම හිඟ ශේෂය තුළ 2010 ට පෙර අක්‍රීය වූ ජල යෝජනා ක්‍රම 5 කින් අය විය යුතු හිඟ ජල ගාස්තු වටිනාකම රු.1,212,959 ක් විය. | හිඟ ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ. | දීර්ඝ කාලයකට පෙර පැවති ජල යෝජනාක්‍රම 05 ක පමණ ජල සැපයුම් විසන්ධි කිරීම මත මෙම හිඟය ඇති විය. එම ජල යෝජනාක්‍රම අක්‍රිය වීමත් සමඟ ජලය බෙදා නොහැරි කාලය සඳහා ද ලේඛනවල බිල් කිරීමක් සිදුව ඇත. එසේ සිදුකළ බිල් කිරීම් හා අය කර ගත නොහැකි මුදල් කපා හැරීමටත් කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,586,750 ක් හා මුද්දර ගාස්තු රු.33,708,123 ක් විය. | හිඟ ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන ලේකම් වෙත අවස්ථා ගණනකදීම ලිඛිතව හා වාචිකව ඉල්ලීම් කර ඇතත් මේ දක්වා එම හිඟ මුදල පියවා ගැනීමට නොහැකි වී ඇත. |

2.2.4 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂවලදී පනවන ලද අධිභාරවලට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට රු.1,716,708 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අය කර නොගත් පාර්ශවයන්ගෙන් අධිභාර කඩිනමින් අයකර ගැනීම හා නොගෙවන පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අයකර නොගත් ඉතිරි මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සභාවට අනුමත වී තිබූ කසළ ප්‍රවාහන කම්පැක්ටර් රථය සඳහා සභාව විසින් දැරිය යුතු රු.4,374,809 ක මුදල 2018 නොවැම්බර් 27 දින මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ වාහනය සභාවට ලැබී නොතිබුණි. | අදාළ වාහනය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ වාහනය සභාවට ලබාදෙන ලෙස හෝ මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ "ආ" කොටසේ 27 හා 28 වගන්ති ප්‍රකාරව දැනට භාවිතා කරන පොලිතීන් දාහකය සහ ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | කඩිනමින් පරිසර බලපත්‍ර ලබා ගැනීම කළ යුතු වේ. | පරිසර බලපත්‍ර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පිළිබඳව සැලසුම් පිළියෙල කර නොතිබූ අතර 2018 වර්ෂය | චක්‍රලේඛ උපදෙස් අනුව තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ තිරසර සංවර්ධන වැඩසටහන් අනුව සිදුකරන වැය කිරීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වමි. |

සඳහා අයවැයෙන් වෙන්කර තිබූ රු.280,000 ක මුදල තිරසර සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,400,000 ක් වටිනා ට්‍රැක්ටර් රථයක් 2018 මැයි 14 වන දින හෝ ආසන්න දිනකදී සභා භූමියේදී ගිනි ගැනීමක් සිදුවී මාස 7 කට වැඩි කාලයක් ගතවී තිබියදීත් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ පරීක්ෂණ කඩිනමින් සිදුකර ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ. | ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත්කර රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති අතර මේ වන විට අදාළ විධිමත් පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වමි. |
| (ආ) | වෙළඳ බලපත්‍ර හා පරිසර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක සිට පවත්වාගෙන ගිය කුකුළන් 500 ත් 1500 ත් අතර ප්‍රමාණයක කුකුළු ගොවිපළවල් 4 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ. | ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර අදාළ වාර්තා ලබා ගැනීමටත් එම ව්‍යාපාර ස්ථාන අවිධිමත් කිරීම සඳහාත් බලපත්‍ර ලබා නොගන්නා හා අවිධිමත් ව්‍යාපාර ස්ථානවලට නීතිමය කටයුතු සිදු කිරීමටත් අදාළ නිලධාරින් වෙත අදාළ වගකීම් හා බලතල ලබාදී ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කාර්යමණ්ඩල තනතුරු 16 ක සේවක පුරප්පාඩු 41 ක් හා තනතුරු 4 ක අතිරික්තතා 10 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම හා අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට පුරප්පාඩු පවතින තනතුරු සඳහා කඩිනමින් සුදුසු සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 මාර්තු 19 දින කොටස් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබූ අංක 4623 දරන ඔප්පුවට අදාළ ලොක්නගර්වත්ත ඉඩමෙන් පොදු කටයුතු සඳහා සභාව වෙත වෙන් කර තිබූ පර්චස් 65.2 ක් වූ අංක 36,37,38 හා 72 දරන ඉඩම් කොටස් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම් කොටස් කඩිනමින් පවරා ගැනීම කළ යුතු වේ. | මෙම ඉඩම් කොටස් සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු සිදු කරමි. |
| (ආ) සභාවේ ජල යෝජනා ක්‍රම 15 ක ජලය බීමට සුදුසු තත්ත්වයක පවතීද යන්න පරීක්ෂා කර වාර්තා ලබාගෙන නොතිබුණි. | පරීක්ෂාවන් සිදුකර කඩිනමින් අදාළ වාර්තාවන් ලබා ගැනීම කළ යුතු වේ. | සෞඛ්‍ය ආරක්ෂක වාර්තාවක් ලබා ගැනීමට මේ වන විට සෞඛ්‍ය වෛද්‍යවරයා වෙත ඉල්ලීම් කර අදාළ ජල සාම්පල් රැගෙන ගොස් ඇති නමුත් මේ දක්වා එම වාර්තාව ලැබී නොමැත. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 318 කින් 263 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ එක් අයදුම්පතක් සඳහා පමණි. | අනුකූලතා සහතික ලබා නොගැනීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | තාක්ෂණ නිලධාරින් මඟින් අධීක්ෂණ කටයුතු සිදුකර එම ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතිකය ලබාදීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. |

3.5 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රිය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 5 කට වැඩි කාලයක සිට ධාවනයෙන් ඉවත්කර තිබූ රු.30,000 ක් වටිනා යතුරුපැදියක් විනාශ වීමට ඉඩ හැර තිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | තක්සේරු වාර්තාව ලබාදීම ප්‍රමාද වීම මත එම යතුරු පැදිය සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති අතර කඩිනමින් කමිටු වාර්තාව ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගෙන වාර්තා කරමි. |

3.6 ප්‍රසම්පාදනය

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සිවිල් වැඩ භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව සැලසුම් පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්ම විධිමත් පරිදි සකස් කර අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වමි. |